# ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ලිපිකාර, කළමනාකරණ සහකාර හා කාර්මික සේවා සංගමය

## සුබසාධන යෝජනා ක්‍රමය

- අප මව් සංගමයට අනුබද්ධව සුබසාධන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මකව පවතියි. ඒ සඳහා සංගමයේ වෘත්තිය සංගම් ගිණුමට අතිරේකව සංගමය නමින් සුබසාධක ගිණුමක් පවත්වා ගෙන යනු ලබයි. වෘත්තිය සමිති සාමාජිකත්වය ලබා ගැනිමෙන් පසු සුබසාධක යෝජනා ක්‍රමයට ඇතුලත් විය හැකිය.

- සුබසාධන යෝජනා ක්‍රමයට සම්බන්ධ විමට වෘත්තිය සමිති සාමාජිකත්වයට අතිරේකව රු. 125ක සාමාජික මුදලක් මාසිකව අය කරනු ලබන අතර සාමාජික ඇතුලත් විමේ ගාස්තුව රු. 100.00 කි.

- සුබසාධක සංගමයේ සාමාජිකත්වය ලබා මාස 06කට පසු පහත පරිදි අවමංගල්‍යාධාර ගෙවිම් සඳහා සුදුසුකම් ලබයි.

    - සාමාජික අභාවයක දී රු. 50,000.00 ක මුදලක් ලබා දිම
    - සාමාජිකයාගේ මවගේ, පියාගේ, කලත්‍රයාගේ මවගේ, පියාගේ සහ කලත්‍රයාගේ අභාවයක දී රු. 12,500.00 ක මුදලක් ලබා දිම
    - සාමාජිකයාගේ මාස 01 සිට මාස 06 දක්වා දරුවන්ගේ අභාවයක දී රු. 7,500.00 ක මුදලක් සහ මාස 06 සිට අවිවාහක දරුවන් දක්වා රු. 10,000.00 ක මුදලක් ලබා දිම

- සුබසාධක සංගමයේ සාමාජිකත්වය ලබා වර්ෂ 10ක් ඉක්මවනතුරු විශ්‍රාම පාරිතෝෂිකය සඳහා සුදුසුකම් නොලබයි.

  වර්ෂ 10 ඉක්මවූ පසු විශ්‍රාම පාරිතෝෂිකය රු. 10,000.00 ක් වන අතර ඉන් පසු සෑම වර්ෂයක් සඳහාම රු. 1,000.00 බැගින් එකතු කර විශ්‍රාම පාරිතෝෂිකය ගෙවනු ලැබේ. මෙහි උපරිමය රු. 30,000ක මුදලකට සිමා කර ඇත.

- සමාජික වෘත්තිය ගැටළු සම්බන්ධයෙන් පරිපාලන අධිකාරීන් හමුවේ පෙනි සිට කරුණු දැක්විමට අවශ්‍ය වන අවස්ථාවන් හී දී රැකවරණ නිලධාරීවරයෙකුගේ සහාය ලබා ගත හැකිය. මෙම වරප්‍රසාදය සෑම වෘත්තිය සමිති සාමාජිකයෙකුටම හිමි වන බැවින් එය වෘත්තීය සමිති ගිණුමේ ආවරණය යටතේ සිදු කරනු ලබයි. ඒ සඳහා දිනකට රු. 2,500.00 බැගින් උපරිම දින 10ක් දක්වා ආවරණය කරන අතර, ශාඛා නිර්දේශය අනුව කරුණු පරික්ෂා කර බලා රැකවරණ නිලධාරී ගෙවිම සිදු කරනු ලැබේ.

- ඔබ ශාඛාවේ නියෝජිතයන් මගින් මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත හැකි අතර වෘත්තිය සංගමයක ආරක්ෂණය යටතේ ස්ථාපිතව පවතින මෙම සුබසාධන යෝජනා ක්‍රමය සඳහා ඔබත් සම්බන්ධ වන්න.


ආර්.ඩී. රෝහිත ධනංජය<br>
ප්‍රධාන භාණ්ඩාගාරික<br>
2026.08.27